සැකසුම - චතුරිකා ප්‍රියදර්ශනී
ර/නිවි/කහවත්ත මධ්‍ය මහා

Education, Sabaragamuwa Province/ Weekly School Department of Education, Sabaragamuwa Province/ Weekly School

## සති පාසල 10.

# බෞද්ධ පූජා කර්ම - II

### මිලින්ද ප්‍රශ්නය.

මෙහි දී නාගසේන හිමියන්ගෙන් මිලිඳු රජු ප්‍රශ්නය පිළිබඳ ව ඉදිරිපත් කෙරේ.

උදා:- මිලිඳු රජු - ස්වාමීනි ඔබ වහන්සේ කවර නම් වීද?

නාගසේන හිමි - මහරජතුමනි මම නාගසේන වෙමි.

මිලිඳු රජු - නාගසේන වූයේ කවරෙක් ද? හිසකේ නාගසේන ද?

නාගසේන හිමි - නැත මහරජ

මිලිඳු රජු - එසේනම් නියපොතු, දත්, සම්, මස්, නහර ආදිය නාගසේන ද?

නාගසේන හිමි - නැත මහරජ

මිලිඳු රජු - එසේනම් රූපය වේදනාව ආදිය නාගසේන ද?

නාගසේන හිමි - නැත මහරජ

මිලිඳු රජු - එසේනම් ස්වාමීනී නාගසේන කෙනෙක් නැත

නාගසේන හිමි - මහරජ කිමෙක් ද තෙපි පයින්ද අයේ ද?

මිලිඳු රජු - සවාමීනි මම රථයෙන් ආමි....

මෙසේ දීර්ඝ ව සාකච්ඡාවක නිරත වීම සිදුවේ. මේ තුළ දැකිය හැකි නාට්‍යමය අංකුර අවස්ථා ගණනාවකි.

- අනුකරණය - ගිහියෙක් රජු ලෙස ඉදිරිපත් කිරීම් කිරීම.
- සමාරෝපය - ගිහියෙක් රාජාභරණ හා කිරුළ පැළඳ මිලිදු රජු ලෙස සැරසීම.
- සංවාද භාවිතය (මිලිදු රජු හා භික්ෂුව අතර සංවාදය)
- වේශභූෂණ - මිලිදු රජුගේ රාජ ඇඳුම්
- අංග රචනය - මිලිදු රජු ලෙස මුහුණ සකස් කිරීම.
- අලෝකය භාවිතය - පන්දම් භාවිතය
- ප්‍රේක්ෂකයා (උපාසක උපාසකයන්)
- සංගීතය (විවිධ ශබ්ද භාවිතා කිරීම)
- නළු නිළියන් (මිලිදු රජු ලෙස සැරසුන උපාසකයන්)

මෙසේ නාට්‍යමය අංකුර අවස්ථා ගණනාවක් මිලින්ද ප්‍රශ්නය තුළ දැකිය හැකි ය. (පාඩම සාකච්ඡා කිරීමේ දී වැඩිදුර විස්තර කෙරේ.)

## පැවරුම

1. මෙම බෞද්ධ පූජා කර්මයට අයත් චරිත දෙකක් ලියා දක්වන්න.
2. මිලින්ද ප්‍රශ්නය නැමති බෞද්ධ පූජා කර්මය කෙටියෙන් විස්තර කරන්න.
3. මෙහි ඇතුළත් නාට්‍යමය අවස්ථා උදාහරණ සහිතව ලියා දක්වන්න.